# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1870/62 – 2014 ජූලි 10 වැනි බ්‍රහස්පතින්දා – 2014.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරුගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, කණුමුල්දෙනිය (අ.ග.පි. 171) ගමේ පිහිටි හම්බන්තොට දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එච්/ඕකේඩබ්/2012/756 හා 2013.03.01 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ', 'බී', 'සී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1585 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන (03):

01. කැබලි අක්ෂර 'ඒ' – බිබුලහේනවත්ත ඉඩම – ප්‍රමාණය: **හෙක්. 0.0527 ක් පමණ**

උතුරට: රාජපුරගේ කවනිහාමි හිමිකම් කියන බිබුලහේනවත්ත, මාර්ගය (මා.සං.අ.) සහ හේවා අලංකාරගේ චන්ද්‍රලතා හිමිකම් කියන බිබුලහේනවත්ත; නැගෙනහිරට: හේවා අලංකාරගේ චන්ද්‍රලතා හිමිකම් කියන බිබුලහේනවත්ත; දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය, රාජපුරගේ කවනිහාමි හිමිකම් කියන බිබුලහේනවත්ත සහ මාර්ගය (මා.සං.අ.).

02. කැබලි අක්ෂර 'බී' – බිබුලහේනවත්ත ඉඩම – ප්‍රමාණය: **හෙක්. 0.0599 ක් පමණ**

උතුරට: රාජපුරගේ කවනිහාමි හිමිකම් කියන බිබුලහේනවත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: කන්දෙබැද්ද කණිෂ්ඨ විද්‍යාලය හිමිකම් කියන පාසල් වත්ත; බටහිරට: කන්දෙබැද්ද කණිෂ්ඨ විද්‍යාලය හිමිකම් කියන පාසල් වත්ත සහ රාජපුරගේ කවනිහාමි හිමිකම් කියන බිබුලහේනවත්ත.

03. කැබලි අක්ෂර 'සී' – බිබුලහේනවත්ත ඉඩම – ප්‍රමාණය: **හෙක්. 0.0459 ක් පමණ**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: රාජපුරගේ අමරසූරිය හිමිකම් කියන බිබුලහේනවත්ත; දකුණට: රාජපුරගේ අමරසූරිය හිමිකම් කියන බිබුලහේනවත්ත, කන්දෙබැද්ද කණිෂ්ඨ විද්‍යාලය හිමිකම් කියන පාසල් වත්ත සහ මාර්ගය; බටහිරට: කන්දෙබැද්ද කණිෂ්ඨ විද්‍යාලය හිමිකම් කියන පාසල් වත්ත සහ මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4-3/8/2012/පීසී/268.
2014 මාර්තු මස 06 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 781

1A – G19891 – 08 (2014/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*